24 වන පිටෙන්

සඳහා යොමුකරන්නට සිදුවීම, ඒ සඳහා විවිධ අධ්‍යාපන පුහුණු පාඨමාලා හරහා දැනුම සහ අවශ්‍ය සුදුසුකම් වර්ධනය කර ගන්නට සිදුවීම ගැටළුවක් නොවනු ඇත.

ඒ සඳහා අපට මෙවැන්නක් යෝජනා කළ හැකි යැයි සිතමි.

(දෙවන රූ පටහන බලන්න)

දැනුම පමණක් නොව, අනෙක් කරුණ වන්නේ, දරුවන් තුළ යහගුණ වර්ධනය සහ අනෙකා පිළිබඳ ගෞරවය මෙන්ම පිළිගැනීම ඇති කිරීමේ, සදාචාරාත්මක ගුණාංග වර්ධනය කිරීමේ ක්‍රමවත් වැඩපිළිවෙල යි. රට පුරා පැතිරී ගිය වාර්ගික වෙනස්කම් අතර වෙනසක් නැති බව ඒත්තු ගැන්වීමත්, මිනිස්කම විනා, ජාති, ආගම්, භාෂා භේද කිසිවකින් මිනිස්කම නොබෙදෙන අයුරුත් කුඩා කල සිට අවබෝධ කරවීමේ ආචාර ධර්ම පද්ධතියක් පාසල මුල් කොට ආරම්භ කිරීමයි. නැතහොත් ඒවා චක්‍රලේඛ වලට සීමා නොකොට ක්‍රියාවේ යෙදවීම යි. ඒ සඳහා ගුරුවරු සහ අදාළ නිලධාරීන් දැනුවත් කිරීම සහ හුරු කරවීමයි. කුමන ජාතියක වුව ද, කුමන ආගමක වුව ද, කුමන භාෂාවක් කතා කළ ද මානුෂීය හැඟීම් බෙදාහදා ගන්නට ඒ කිසිවක් බාධාවක් නොවන බව දරුවාට තේරුම් කර දීම සහ විශේෂයෙන් සියලු පාසල් සඳහා සිංහල, දමිළ සහ ඉංග්‍රීසි භාෂා සඳහා ගුරුවරු පත් කළ යුතු ය.

අප දන්නා පරිදි, ඉංග්‍රීසි සහ දමිළ භාෂා සඳහා ප්‍රමාණවත් ගුරුවරු නැති අතර ඒ සඳහා ඔවුන් පුහුණු කිරීමට හැකි ය. උසස් පෙළ සමත් සිසුන්, උපාධිධාරීන් මේ සඳහා යොමු කර ගැනීමෙන් ඒ ප්‍රශ්නය පහසුවෙන් විසඳා ගත හැකිවා පමණක් නොව රැකියා වියුක්තිය පිළිබඳ ප්‍රශ්නය ද, තව දුරටත් විසඳා ගත හැකි ය. එපමණක් නොව, ඉංග්‍රීසි භාෂා ගුරුවරුන් පුහුණු කොට පහළ පංති වල දී ම ක්‍රමවත්ව සහ අඛණ්ඩව ඉගැන්වීම ඇරඹිය යුතුම ය. එමඟින් සියලු දරුවන් ට ලෝකය විවෘත වන ආකාරයත්, එය රටක සංවර්ධනය ට ඉමහත් රුකුලක් වන බවත්, අප වටහා ගත යුතු ය.

එමෙන් ම අපි දන්නා පරිදි නගරබද පාසල් වලට ප්‍රමාණවත් ගුරුවරු සිටිය ද, ගම්බද බොහෝ පළාත් වල, දමිළ සහ ඉංග්‍රීසි පමණක් නොව ගණිතය, විද්‍යාව වැනි  බොහෝ විෂයයනට ප්‍රමාණවත් ගුරුවරු නැති බව ප්‍රකට කරුණකි. එයට නිසි පිළියම් යෙදීම නිසි ආකාරයෙන් නොවන බව ද පැහැදිලි ව පෙනෙන්නට තිබේ. එබැවින්, නව ගුරුවරු බඳවා ගැනීම සහ ගුරු පුහුණුව ලබා දීමට කඩිනම් පියවර ගත යුතු ය. දිගුකාලීන පියවර සේ මෙය විශ්‍රාම ගන්නා ගුරුවරුනට ඉදිරිගාමී ව, සහ අඛණ්ඩව කළ යුතු වැඩපිළිවෙල කි. නවක ගුරුවරු වාර්ෂිකව බඳවා ගැනීම, ගුරු වෘත්තියේ ගරුත්වය සුරක්ෂිත කරදීම, ගුරුවරුනට අවශ්‍ය දීමනා, නේවාසික සහ අනෙකුත් පහසුකම් සැපයීම පිළිබඳව ද අධ්‍යාපන අමාත්‍යංශයේ විශේෂ අවධානය  යොමු විය යුතු ය.

අනෙක් අතට, යහපත්, නිර්මාණශීලී දරුවන් බිහි කිරීම සඳහා සාහිත්‍යය සහ කලාව ආශ්‍රිත විෂයයන් කෙරෙහි ද නොදෙවෙනි ස්ථානයක් පාසල් අධ්‍යාපනය තුළ අඩංගු කළ යුතු ය. උගතුන් පමණක් බිහි වීමෙන් රටකට සුගතියක් ඇති වන්නේ නැත. පැහැදිලි සහ හෘදයංගම චින්තනයක් ඇති කරවීමෙහි ලා, නැතහොත් ඊට දරුවන් හුරු පුරුදු කරවීමෙහි ලා විෂයය නිර්දේශ මඟින් යම් පෙළඹවීමක් ඇති කළ හැකි ය.  කලා විෂයයන් ට නිසි පිළිගැනීමක් සමාජය තුළ ඇති කළ යුතු ය.

භාෂා ඉගැන්වීමට මුල් තැනක් දීමෙන් අනාගත පරපුරක සමාජයීය ප්‍රශ්න ද බොහෝ දුරට විසඳෙනු ඇති අතර, පාසල් මට්ටමේ වැඩ සටහන් යටතට එකතු කළ යුතු තවත් විශේෂ කාරණාවක් වන්නේ, 10 වන ශ්‍රේ□යේ සිට දරුවන් ට පාසල් හුවමාරු වැඩසටහන් වලට යාමයි.

බටහිර රටවල මෙය ඉතා හොඳින් ක්‍රියාත්මක වන අතර, ඉන් ඉතා සාර්ථක ප්‍රතිඵල ලැබෙන බව අපට පෙනෙන්නට තිබේ. පිටරට වල සිටින ශ්‍රී ලාංකික දරුවන් ද බේවායෙන් ලබා ගන්නා ඵල ප්‍රයෝජන ඉමහත් ය. ඒවා ක්‍රියාත්මක වන්නේ, බටහිර රටවල අධ්‍යාපන ක්‍රමවේද තුළ, භාෂා කිහිපයක් හැදෑරීමට දරුවාට ඇති අවස්ථාවන් මත ය. එම භාෂාව සහ අදාළ භාෂාව පරිහරණය කරනු ලබන සමාජයේ සංස්කෘතිය දැන හඳුනා ගැනීමේ වැඩපිළිවෙල වශයෙන් මෙම පාසල් හුවමාරු ක්‍රියාවලිය සිදු වෙයි. බොහෝ විට සති දෙකක් හෝ ඊට එහා මෙහා වන කාල පරිච්ඡේදයක් තුළ දී මෙම හුවමාරුව සිදු වෙයි. (මාස කිහිපයක හෝ වසරක වැනි කාලයක හුවමාරු ක්‍රම ද වෙයි.) ආගන්තුක රටෙහි තෝරා ගන්නා ලද විශ්වාසනීය පවුලක වගකීම යටතේ දරුවන් එම කාලය ගත කරන අතර, එම රටෙහි භාෂාව ද, ඔවුන ගේ කෑම බීම සහ සංස්කෘතිය හඳුනා ගැනීම ද සිදු කරනු ලබන ලබයි. එමෙන්ම, පාසල් කාලය තුළ දී, එම ආගන්තුක රටෙහි පාසලකට එම දරුවන් බද්ධ කොට පාසල් යාම ද සිදු කරනු ලබයි. සවස් කාලයේ දී, අදාළ රටෙහි පරිසරිය සහ විශේෂිත ස්ථාන දැකබලා ගැනීම ද ගුරුවරුන් විසින් මනා කොට සැලසුම් කරයි. යුරෝපය, ඇමෙරිකාව, ඕස්ට්‍රේලියාව වැනි රටවල මෙම පාසල් හුවමාරු ක්‍රමයෙන් සිසුන් ලබා ගන්නා අත්දැකීම් ඔවුනගේ අනාගතයට පෞද්ගලිකව ද, රැකියාවට ද අපමණ ප්‍රයෝජනයක්, නැතහොත් වාසි රැසක් එකතු කරයි.

### අපට බැරි ඇයි?

ඉදහිට දවසක සිසුන් අධ්‍යාපන චාරිකාවකට එකතු කරගන්නවා හැරෙන්නට එවන් වැඩපිළිවෙලක් සකස් කරගන්නට අපට බැරි ඇයි? සියලු සිංහල පාසල් හි දමිළ භාෂාව ද, දමිළ පාසල් හි සිංහල භාෂාව ද අනිවාර්යය කොට ඇති අතර එම ප්‍රායෝගික අත්දැකීම් දරුවන්ට ලබා දෙන්නට අපට බැරි ඇයි? පාසලේ විෂයය භාර ගුරුවරුන් විසින්  තෝරා  ගැනෙන වගකීම් සහිත පවුල් කිහියක එකතුවෙන් උතුරින් දකුණට ද, දකුණින් උතුරට ද මෙම අධ්‍යාපනික සහ සංස්කෘතික හුවමාරුව ආරම්භ වන්නේ නම්, රටේ අනාගතය බාර ගන්නා දරුවන් කෙතරම් පරිණත පුද්ගලයන් බවට පත්වෙනු ඇත් ද? පාසල් කාල සීමාවේ දී හුවමාරු පාසලට අනුයුක්ත කිරීම මඟින් භාෂා දැනුම වර්ධනය කරගැනීමට ද රුකුලක් වනු නොඅනුමාන ය. එමඟින් ඇතිවන්නේ "එක් දරු පරපුරක්" වන අතර, මිනිස්කම් පිරි මිනිසුන් බිහිකිරීමේ අවසාන අභිලාෂය සඵල වීමයි.

අනෙක,
මේ සියලු කාරණා විමසා බැලීමේ දී, පිරිපුන් මිනිසුන් ද, එ මඟින් පිරිපුන් සමාජයක් ද, ආර්ථික වශයෙන් දියුණු සමාජයක් ද අප ඉදිරියේ වෙයි.

යහපත් සමාජයක් ගොඩ නැංවීම ට නම්, වඩා හොඳ දේ දිය යුත්තේ දරුවන් ට ම ය!
ඒ, වඩා හොඳ දේ දරුවන් ට දිය යුත්තේ, වැඩිහිටියන් වන අප විසින් ම ය.

-බුන්දි-

## "දහම්සරණ" එළිදැක්වෙයි




ඔස්ට්‍රේලියාවේ සිංහල පුවත්පත් අතරට අලුතින්ම එකතුවන පුවත්පත "දහම්සරණ" නමින් පසුගියදා එළිදැක්වුණි.

"දහම්සරණ" ඉඳිපරපේ ධම්මසිරි ස්වාමීන් වහන්සේගේ උපදේශක සංස්කාරකත්වයෙන් එළි දැක් වී ඇති අතර වියත් ලේඛකයන් රැසකගේ ලිපි අඩංගුවෙයි.

ඕස්ට්‍රෙලියාවේ වෙසෙන සිංහල පාඨකයනට බුදු දහම සම්බන්ධ ප්‍රකාශන කියවන්නට ලැබෙන්නේ මඳ වශයෙන් බැවින් එම අවශ්‍යතාව සම්පූර්ණ කිරීම මෙම සඟ'රාවේ අරමුණ යයි සංස්කාරක සටහනේ දැක්වෙයි.

"දහම්සරණ" ද්විමාසික සඟරාවට සන්නසේ සහෝදරාත්මක සුබපැතුම් මෙසේ එක්ක-

**VCE Chemistry 2014**

Individual and Groups
Early completion of syllabus and Exam preparation
Home Visited

**Priyantha Liyanage**
0407664546

**LANKAN AUTO CARE**
**Licensed Roadworthy Tester (R.W.C)**



ALL MECHANICAL REPAIRS
LOG BOOK SERVICE | ELECTRICAL REPAIRS
AUTO TRANSMISSIONS | BRAKES & CLUTCHES
FUEL INJECTION | COMPUTER DIAGNOSTIC




Ranjith Perera
Mob: 0409 866 886

**9798 2200**
**14/30 Tower Court**
**Noble Park 3174**

**FOR ALL YOUR TRANSLATIONS**
PROFESSIONAL TRANSLATOR
NAATI accredited (Level 3)

(ENGLISH < > SINHALESE)

Documents for immigration purposes
BIRTH , MARRIAGE, DEATH
EDUCATIONAL/ VOCATIONAL
LEGAL and POLICE DOCUMENTS
NATIONAL IDENTITY CARDS

CONTACT
**DR. PREMA KUDALIGAMA**
( BA, PGDE, M.A. Ph.D(Edu.)
NAATI Level 3 (Interpreting & Translating)

Tel:(03) 94671658 mob: 0458 60 60 66
Email: premakudali@ gmail.com
**BUNDOORA, VICTORIA 3083**